

## නත්තල උදාවෙයි

ගිම්හාන උනුසුමින් දස දෙස වෙලා ගනියි
ගහකොල ලිය මඩුලු මලින් පිරී දිලෙ  යි
රූං හඬ දෙමින් බමරුන් මල්වලට ඇදෙයි
නත්තල් උදාවෙන ලකුණුත් අවට පෙනෙයි

ජේසු තුමාගේ උපත මුල් කර ගනිමි   න්
ඒතුමාගේ මහගු ජීවන තතු ඇසුරි    න්
නත්තල සමරමින් ඒතුමට බැති පුදමි   න්
සතුටින් පිරි විනෝදයක් ලබති කිතු බැතියන්

සාමය උදාවේවා යන පිවිතුරු හැගුමෙන්
බැතිමතුන් වරින් වර එදිනට පල්ලි යමින්
පූජකතුමාගේ දේශන අසා දේව මෙහෙයේ යෙදෙමින්
ආධ්‍යාත්මිකව සතුටක් ලබති කිතු බැතියන්

උත්සව පැවැත්වීමට මුදල් වැයකර නිර්ලෝභිව
තෑග බෝග බෙදා හදාගෙන සුහද          ව
සාමය සතුට සමගිය ප්‍රීතිය කැටු          ව
නත්තල් සතුට විඳිනව වාදභේද දුරු          ව

පොඩිත්තන්ගේ හද දිනු නත්තල් ග    ස
නා නා විසිතුරු මෙවලමින් සර        සා
නත්තල් සීයා බෙදනා තෑගි පිණි       ස
මග බල බලා සිටි පොඩිවුන් වඩා තොස

නත්තලට අවශ්‍ය කරන හැම බඩු බාහිරාදිය
කඩ සාප්පුවල පිරී ඉතිරෙන සමයක්  ය
තෑග බෝග කෑම බීම රෙදිපිළි සැරසිලි ආදිය
තෝරා ගනිති ලහි ලහියේ මේ දිනවල තුටුව

නන් විසිතුරු ඇඳුම් ආයිත්තම් පැළැ  ඳ
ඉමිහිරි රසැති කෑම බීම කා බී          ද
ගයා  වයා නටා ලෙන්ගතුව සතුටින් ද
නත්තල් ප්‍රීතිය භුක්ති විඳි නන් අයුරින්ද

නැතිබැරි අයට හැකි අය උදව් උපකාර කරමින්
සාමයෙන් සමාදානෙන් සමගියෙන් එක්රැස්විමෙන්
නත්තල් ගී ගයන්නට හා ඇසීමට සිත් යොමුකරමින්
ගිනිකෙළි රතිඤ්ඤා හඬ පතුරුවති උද්දාමයෙන්

ජීවන ශුභ සිද්ධියට යහපත් වදන් සඳහ     න්
නත්තල් ශුභ පැතුම් පත් හුවමාරු කරගනිමි න්
තම සතුට ප්‍රීතිය අන් අය හා විඳ ගනිමි      න්
එදින අර්ථවත් ලෙස ගතකරති කිතුනු බැතියන්

සෙනෙහෙලත් රත්නායක
ග්ලෙන් වැවර්ලි

## සැමට සුභ නත්තලක් උදා වේවා

තරු එළියෙන් දීප්තිමත් ආලෝකයක් පැතුරුණේය
සීනු හඬින් මුළු ලොවම අවදි කළේය
ජේසු කොමරු මුළු ලොවම අවදි කළේය
රජවරු තිදෙන ජේසු බිළිඳාව බැහැදකින්නට විය
දුප්පත් එඬේරු මෙපුවත දැන ප්‍රීතියට පත්විය
මුළු රාත්‍රියම තරු එළියෙන් බැබලෙන්න විය
අපට ගැලවුම්කායෙක් ලැබුණේය
ගීතිකා ගායනා කරමින් දේවස්ථානය පිරෙන්ට විය
මහා මුහුදේ මහාගෝෂාව අඩුවිය
වසු පැටවා උම්බෑ ගාමින් දුවන්නේය
අත්තෙන් අත්තට ඉගිලෙන පක්ෂීහු කෑමොර දෙන්නේය
අපට ප්‍රතාපවත් දෙවිකෙනෙක් දෙන්නේය
වනයේ සිව්පාවෝ ආහාර සොයා යන්නෝය
දේව දූතයෝ ප්‍රීතියෙන් ගීතිකා ගයන්නේය
මරි මව් ඉතා ප්‍රීතියෙන් බිලිඳාව රැක ගන්නේය
ජේසුතුමාව ජුසේතුමා සන්තෝසයේ බලා ඉන්නේය
අපට සාමයේ කුමරෙක් දෙන ලද්දේය
අපට දිළිඳු රජතුමෙක් ලැබුණේය

බෙනඩික් පෙරේරා
හැම්ටන්පාක්

## නත්තලේ අරුත

සීතල රැයෙක තරු මල් පිපි දිනෙක එදා
මග සලකුණු කළා එක් තරුවක් රැස් විහිදා
ගව එඬේරුන් බලා අරුමය දෑස විදා
සතුටින් ඉපිල ගියෙ දැක 'ජේසුස්' බිලිඳා

පව්කම් නිසා දුක් ගිනි මැදස දැවෙන සත
මුදවා ගන්න මග හෙළි කළයුතුව ඇත
අරමුණ ඇතිව මෙලොවට එව් දෙව් දූත
ඉපදුනි නමින් පතලව 'ජේසු' දියත

නත්තල් දිනයෙ සිත්ගත් සිදුවීම මෙයයි
බයිබලයෙන් කියන නව තොරතුරු බොහොමයි
වැදගත් වෙන්න කිතුදහමේ ඇති හරයයි
නත්තල් දිනයෙ ඒ ගැන සිහි කළොත් අගෙයි

සාමය බිඳවැටී ලොව හැම තැන යුද්ද
භීතිය රජ කරයි තැන තැන දර සද්ද
භේදය නිසා මිනිසත් ගුණ වැනසේද
උරුමය කාගෙ කාගෙත් හෙට වැළලේද

සාමය පෙරටු කොට නත්තල සිහි කරමු
භේදය සදහටම කවුරුත් පිටු දකිමු
දානය පරිත්‍යාගය දිරිමත් කරමු
ප්‍රේමය හැම දෙනාටම එක ලෙස වඩමු

නත්තල අරුත හැමටම ලොව වැටහේවා
සිත්තුළ සාම සිතුවිලි මල් පිබිදේවා
මෙත්ගුණ සිසිල හැම සිත්තුළ ඉතිරේවා
නත්තල් සාමයෙන් මුළුලොව සැනසේවා

ජයසේන කොඩිතුවක්කු
මෙල්බර්න්



## මා දුටු මෙල්බන් නුවර

සිහළ වතක් දුටු විට මෙල්බන් මගතොට
චිචී අපුලෙන් අහක බලයි හනිකට
මච්චිම නොවන උන් මග තොටදී දුටු විට
සිනහ පොදකක්වත් ගෑවී එබෙයි වතට

දෙව්ලොව සේ සිතු පැතු දේ එක තැනක
කඩමංඩියේ බඳු එක වහලේ බිමක
නැත මුර, අයකැමි රස්ස කිසි ලෙසක
පණ නැති මැෂිම අයකර ගනි සැම මිලක

දෙවන සිල් පදය මේ නගරයෙ වැසියෝ
කිසිදා සමාදන් වී නොඇසුවෝ
සොර සිත උරගාන ගල මෙහි වැසියෝ
මෙ කඩ මංඩි දෙව්ලොව බැව් මා දුටුවෝ

ලස්සන නෙක පාට මල් දසතම පිරිලාය
එනමුදු සමනල බිඟු විහගුන් වැඩ වරලාය
හේතුව කිමදැයි දන්නා කිසිවකු විමසාය
මගෙ මව්බිමේ නම් උන් දසතම පිරිලාය

අම්ම කියන පිරිසිදු කම බත් දා කෑ හැකිය
මෙහි මං මාවත් ගෙවතු සැම තැන ඒ බඳුය
නිසි පිළිවෙළක් සැම තැන නිතරම ඉස්මතුය
ඉන් පිට පනින නොදැමුණු සිත් තල මල බඳුය

සු ගා පුංචිහේවා
හලාවත

## අසිරිමත් නත්තල

ශීතල පහව ගොස් උණුසුම රජ වෙනවා
ගස් වැල් අතු පතර දසදෙස විහිදෙනවා
නෙක නෙක පාට මල් ගොමු දිස්වෙනවා
පරිසරයම නැවුම් බවකින් ඔප   වෙනවා

වසර ගෙවී යන්නට කාලය              එළඹෙයි
කිතුනුවන්ට විශේෂ කාල පරිච්ඡේදයක් උදා කරයි
කිතු උපත පාදක කරගෙන නත්තල      සමරයි
ඔවුන්ගේ සිත් සතන් සතුටින් උතුරා        යයි

සාප්පු පිරී නත්තල් බඩු ගොඩ  ගැසිලා
යන එන්නන් ඒ මේ අත පොදි   බැඳිලා
රතු කොල රන් රිදී පැහැ බඩු තෝරාලා
තෑගි ගනී අත දිගහැර වැය       කරලා

බෙත්ලෙහෙමේ ගව ලෙන සිහි වෙනවාය
ජේසු බිළිඳුගේ අසිරිය දැනෙන     වාය
සාම පණිවිඩය ලොවටම        බෙදුවාය
කිතුනුවෝ ඒ මගට පෙල       ගැසුනාය

නත්තල් දින දෙව් මැදුර කිතුනවෝ ගොසින්
දේව මෙහෙයට සහභාගි වෙමින් බැතියෙන්
දියත් කළ වැඩ සටහන් වලට එක්වෙමින්
ජේසු තුමාගේ ගුණ කඳ සිහිකරයි තුටින්

නන් විසිතුරු ඇඳුම් පැලඳුම් හැඳ       පැලැඳ
දොරින් දොර පලින් පල පැවැත්වේ සාද
රසවත් කෑම බීමේ රස පහස         විඳ
නත්තල් දින ගත කරයි හැම සතුට  මැද

සිත් තුළ නැගෙන ප්‍රීතිය මේයයි කියන්නාක් මෙන්
තෑගි බෝග ලොකු කුඩා හැම හුවමාරු කරගනිමින්
සැම දෙනා එක්වී නටා, ගයා, වයා විනෝද වෙමින්
නත්තල ගත කරන්නේ මෙලොව සුරලොව මවමින්

සාප්පු ගෙවල් ප්‍රසිද්ධ මං මාවත්   අසල
කිතු දහමේ සංකේත වලින්        සරසල
රාත්‍රී කාලයේ පාට පාට විදුලි බුබුලු දල්වල
නත්තල් අසිරිය පෙන්වයි විසිතුරුව මවල

නත්තල් බඩු ගන්න සාප්පු යන        විට
පොඩි ළමයින්ගේ සිත් දුවනව නත්තල් ගසට
සීනු, තරු, රිබන් පටි විදුලි බුබුලු    ගන්ට
සිත යොමු කරයි නත්තල් ගස  සරසන්ට

ළමා සිත් විශේෂ අවධානයට              ලක්වෙන
නත්තල් සීයා තෑගි මල්ලක්              රැගෙන
ළමයි වෙත පැමිණ තෑග බෙදා             දෙන
ඔවුන් මහත් සතුටක් ලබනව තෑගි          ගෙන

සෙනෙහෙලත් රත්නායක
ග්ලෙන් වැවර්ලි

